**01-12-2025 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, සෑම දිනකම ඥාන සාගරය කැලතීම මඟින් ඔබගේ සතුටේ රසදිය කඳ ඉහළ යනු ඇත. එහෙ මෙහෙ යන එන අතර තමන් ස්ව දර්ශන චක්‍රධාරීන් බව සෑම විටෙකම සිහියේ තබා ගන්න.

**ප්‍රශ්නය:** ස්ව වර්ධනය සඳහා පහසුම මඟ කුමක් ද?

**පිළිතුර:** ස්ව වර්ධනය සඳහා දෛනික වාර්තා සටහනක් තබා ගන්න. තමාව පරික්ෂා කර ගන්න: අද දවස පුරා මම කුමන හෝ ආකාරයක යක්ෂ ක්‍රියාවන් සිදු කළාද? ශිෂ්‍යයින් තම වාර්තා සටහන පවත්වා ගන්නාක් සේ ඔය දරුවනුත් ඔබගේ දිව්‍යමය ගුණ ධර්ම වල වාර්තා සටහනක් තබා ගෙන සිටියහොත් දිගින් දිගටම ඔබට වර්ධනීය තත්ත්වයක් කරා යා හැකි වේවි.

**ගීතය:** දුර ඈත දේශයේ වැසියාණන් මෙම විදේශයට පැමිණ සිටියි.

ඕම් ශාන්ති. දුර ඈත දේශය යනු කුමක්දැයි කියා ඔබ දරුවන් දන්නවා. පිට ලෝකයේ සිටිනා එකම එක මනුෂ්‍යයෙක්වත් මෙය දන්නේ නැහැ. කෙනෙක් කෙතරම් උදාර මහා පණ්ඩිතයෙක් වුවත් මෙම කියමනේ අරුත ඔවුන් දන්නේ නැහැ. දෙවියන් යන නාමයෙන් සෑම කෙනෙක්ම සිහිපත් කරනා පරමාත්ම පියා අනිවාර්යයෙන්ම අශාරීරික ලෝකයේ ඉහළින් ම සිටිනා කෙනෙක් බව ඔය දරුවන් දන්නවා. වෙන කිසිම කෙනෙක් මෙය දන්නේ නැහැ. මෙම නාටකයේ රහස් දැන් ඔය දරුවන් දන්නවා. ආරම්භයේ සිට සිදුවුණු සෑම දෙයක්මත් ඉදිරියට සිදුවීමට යන සෑම දෙයක්මත් ඔබලාගේ සිහියේ තිබෙනවා. මෙම ලෝක චක්‍රය කැරකැවෙන්නේ කෙසේද යන්න පිළිබඳ වූ ඥානය ඔබලාගේ සිහියේ තිබිය යුතුයි. ඔය දරුවන් අතරිනුත් සෑම කෙනෙක්ම මෙය තේරුම් ගන්නේ එක් එක් මට්ටම් වලින්ය. ඔබගේ සතුටේ අංශක ඉහළ යන්නේ නැත්තේ ඔබ ඥාන සාගරය ආවර්ජනය කරමින් එය මත නොගාන නිසයි. ඉඳගෙන සිටිනා විටත්, යන එන අතරමඟදීත් ඔබගේ සිහියෙන් තමන් දැන් ස්ව දර්ශන චක්‍රධාරීන් බව සිහිපත් කර ගත යුතුයි. ජීවාත්මය වන මම මෙම චක්‍රයේ මුල සිට අග දක්වා වූ සියල්ල දැන ගෙන සිටිමි. ඔබ මෙහි අසුන් ගෙන සිටිනවා: නමුත් ඔබගේ සිහිය ඇත්තේ පරමාත්ම ලෝකයේයි. එය මිහිරි නිහඬ නිවහනයි. නිර්වාණ දේශයයි. නිහඬ දනව්වයි. ජීවාත්ම සත්තාවන් වාසය කරන්නේ එහියි. මෙය ඉතාමත් ඉක්මනින් ඔය දරුවන්ගේ සිහියට ඇතුළු වෙනවා. වෙන කිසිම කෙනෙක් මෙය දන්නේ නැහැ. ඔවුන් විවිධාකාර වූ ග්‍රන්ථ ගණනාවක් ඉගෙන ගෙන ඒවාට ඇහුම් කන් දිගෙන සිටියත් එයින් ඔවුන්ට කිසිම යහපතක් සිදුවන්නේ නැහැ. ඒ සෑම කෙනෙක්ම සිටින්නේ පහළට ඇද වැටීගෙන යන මාවතේ වන අතර ඔබලා දැන් ඉහළට නඟිමින් සිටිනවා. ඔබලා දැන් සුමිහිරි නිවහන වෙතට යාමට සූදානම් වෙමින් සිටිනවා. අපි මෙම පැරණි ඇඳුම් ගලවා දමා සුමිහිරි නිවහනට යා යුතුයි. සතුට ඇත්තේ මෙහියි. සුමිහිරි නිවහන බලා යාමට කල්ප භාගයක් පුරාම ඔබ භක්ති වන්දනාවේ නිරත වෙමින් පැමිණියා. ඉණිමඟේ පහළටම ඇදගෙන වැටෙමින් පැමිණියා. බාබා දැන් සෑම දෙයක්ම ඉතාමත් පහසුවෙන් ඔබට පහදා දෙනවා. පරමාත්ම දෙවි පියාණන් තමන්ට උගන්වනවාය යන සතුට ඔබලා තුළ තිබිය යුතුයි. මේ සම්බන්ධයෙන් ඔබලා තුළ ලොකු සතුටක් තිබිය යුතුයි. පරමාත්ම පියාම පැමිණ ඔබට උගන්වනවා. සියලු දෙනාගේම පියා වන බාබා දැන් නැවතත් වතාවක් අපට උගන්වනවා. ඔහු අපට අනේක වාරයක් උගන්වා තිබෙනවා. ඔබ මුළු කල්පය වටාම ගිය පසුව පමණයි පරමාත්ම පියා පැමිණෙන්නේ. දැනට ඔබලා ස්ව දර්ශන චක්‍රධාරීන්ය. ඔබලා විෂ්ණු දේශයේ දේවතාවරුන් වීමට උත්සාහ දරමින් සිටිනවා. මුළු ලෝකයේම වෙන කිසිම කෙනෙකුට ඔබට මෙම ඥානය දෙන්න බැහැ. ශිව බාබා අපට උගන්වනවා. ඔබලා තුළ විශාල සතුටක් තිබිය යුතුයි. ඒ ග්‍රන්ථ ආදිය සියලුම දේ භක්ති මාර්ගයට අයිති ඒවා බව ඔබ දන්නවා: ඒවා ඇත්තේ විමුක්තියට නොවෙයි. භක්ති මාර්ගයේ සියලුම ආටෝප සැරසිලිත් අවශ්‍යයි. සීමාවක් නැති ආටෝප රැසක් තිබෙනවා. පරමාත්ම පියා කියනවා: ඒ සෑම එකක්ම මඟින් ඔබ එන්න එන්නම පහළට ඇදගෙන වැටිලා. මෙපමණ කාලයක් පුරා අරමුණකින් තොරව එහෙ මෙහෙ ගිය ඔබලා දැන් නිහඬව මෙහි අසුන් ගෙන සිටිනවා. ඔබගේ සියලුම කැළඹිලි දැන් අවසන් වෙලා. ජීවාත්ම සත්තාව පාරිශුද්ධ කර ගැනීමට ඉතිරි වී ඇත්තේ ඉතාමත් කෙටි කලක් බව ඔබලා දන්නවා. පරමාත්ම පියා දැන් මෙය කිරීමේ මඟ ඔබට පෙන්වා දෙනවා. ඔහු කියනවා: මා සිහිපත් කරන්න. තමෝප්‍රධාන් ඔබ සතෝප්‍රධාන් වේවි. ඉන් අනතුරුව ඔබ

සතෝප්‍රධාන් ලෝකය පාලනය කිරීමට යාවී. පරමාත්ම පියා අනේක වාර ගණනක් සෑම කල්පයකම මෙය ඔබට පෙන්වූවා. ඔබත් ඔබගේ තත්ත්වය පරික්ෂා කර බැලිය යුතුයි. ශිෂ්‍යයින් තම තමන්ව දක්ෂයින් කර ගැනීමට උත්සාහ දරනවා. ඔවුන්ගේ ඉගෙනුමත් හැසිරීම් රටාවත් පිළිබඳ වාර්තා සටහන් තිබෙනවා. මෙහිදීත්, ඔබ දිව්‍යමය ගුණධර්ම ධාරණය කරගත යුතුයි. ඔබගේ දෛනික වාර්තා සටහනක් තබා ගැනීම තුළින් ඔබට වැඩි දියුණුවක් ලද හැකි වේවි. මම අද කුමන හෝ ආකාරයක යක්ෂ ක්‍රියාවක් කළාද? මම දේවතාවරයෙක් විය යුතුයි. ලක්ෂ්මි හා නාරායන්ගේ පින්තූර ඔබ ඉදිරියේ තිබෙනවා. එය එතරම් සරල පින්තූරයක්. ශිව බාබා ඉහළින්ම සිටිනවා. ඔහු ප්‍රජාපිතා බ්‍රහ්මා මඟින් මෙය ඔබට උරුම කර දෙන නිසා අනිවාර්යයෙන්ම මෙම සංගම යුගයේ දී බ්‍රහමින්වරුන් සිටිය යුතු වෙනවා. දේවතාවරුන් සිටියේ ස්වර්ණමය යුගයේයි. බ්‍රහ්මා සිටින්නේ සංගම යුගයේයි. ශුද්‍ර වංශයට අයිති අය සිටින්නේ කලි යුගයේයි. බහුරූපී පිළිමයත් ඔබගේ සිහියේ තබාගත යුතුයි. අපි දැන් බ්‍රහ්මින්වරුන්. මුදුන් මල්කඩ, අපි දැන් දේවතාවරුන් වෙමු. අප බ්‍රහ්මින්ව දේවතාවරුන් කරවීමට පරමාත්ම පියා අපට උගන්වනවා. එමනිසා, ඔබ දිව්‍යමය ගුණධර්මත් ධාරණය කර ගත යුතුයි. ඉතාමත් සුමිහිරි අයෙක් වන්න. කිසිම කෙනෙකුට දුකක් නොදෙන්න. ඔබගේ ශාරීරික ජීවිකාව සඳහා එක් එක් ආකාරයේ දේ කරන්නාක් සේ මෙහිදීත් ඔබ මෙම යඥාවට සේවය කළ යුතුයි. කෙනෙක් අසනීප වී කිසිම සේවයක් කරගත නොහැකිව සිටිනා විට අනිත් අය ඔහුට සේවය කළ යුතුයි. අසනීපයෙන් සිට කෙනෙක් ශරීරය අතහැර ගිය පසු දුක් වීමෙන් හෝ අඬා දොඩා වැලපීමෙන් ඵලක් වන්නේ නැහැ. බාබාව සිහි කරමින් ඔබ පූර්ණ නිහඬියාවේ සිටිය යුතුයි. කිසිම ශබ්දයක් නොතිබිය යුතුයි. මළමිණියක් සොහොන් බිමට ගෙන යන විට රාමා ඔබ සමඟයි කිය කියා ඔවුන් ශබ්ද නගා කෑ ගසනවා. ඔබ කිසිවක් කිව යුත්තේ නැහැ. ඔබ ලෝකය ජය ගන්නේ නිහඬතාවයේ බලයෙනි. ඔවුන්ගේ විද්‍යාව වන අතර ඔබගේ ඇත්තේ නිහඬ බවයි. ඔය දරුවන් ගයාන් හා විගයාන් යන්නෙහි නියම අරුතත් දන්නවා. ගයාන් අවබෝධය වන අතර විගයාන් යනු සියල්ල අමතක කර ඥානයෙනුත් ඔබ්බට යාමයි. ගයාන් වගේම විගයානුත් තිබෙනවා. තමන් නිහඬ දේශයේ වැසියන් බව ඔය ජීවාත්මයන් දන්නවා. ඒ වගේම ගයානුත් තිබෙනවා. ඔබලා රූප් හා බසාන්ට්ය. (ඥාන මිණිමුතු වස්සන නිහඬ බවේ ප්‍රතිරූපයන්) බාබාත් රූප් හා බසාන්ට්ය. ඔහු රූප් වෙනවා සේම මුළු ලෝක චක්‍රයේම ඥානයත් ඔහුට තිබෙනවා. එක් ගොඩනැගිල්ලක් ගයාන්විගයාන් කියා නම් කර තිබෙනවා. නමුත් ඔවුන් එහි අරුත දන්නේ නැහැ. දැන් වර්තමානයේ විද්‍යාව දුකත් සතුටත් දෙකම ඇති කරවන බව ඔය දරුවන් දන්නවා. එහි ඇත්තේ සතුටම පමණයි. මෙහි ඇති සතුට තාවකාලිකයි. අන් සියල්ල දුකම පමණයි. මිනිස්සු තම තමන්ගේ නිවෙස් වලම වුණත් සිටින්නේ අසතුටින්. ඉක්මනින් මිය ගියහොත් ඉක්මනින්ම මෙම දුකින් නිදහස් විය හැකියි කියා ඔවුන් හිතනවා. දෙව්ලොව වැසියන් බවට ඔබව පත් කර වීමට බාබා පැමිණ සිටිනා බව ඔය දරුවන් දන්නවා. බාබා එසේ අපව දෙව්ලොව වැසියන් කරවීමට සෑම කල්පයකදීම පැමිණෙනවා. එමනිසා, එවන් පියෙකුගේ උපදෙස් ඔබ අනිවාර්යයෙන්ම පිළිපැදිය යුතුයි. පරමාත්ම පියා කියනවා: සුමිහිරි දරුවනී, කිසිම කෙනෙකුට දුකක් දෙන්න එපා. ඔබගේ නිවහනේම ජීවත් වෙමින් සිටිනා අතර පාරිශුද්ධ වන්න. අපි සෑම සහෝදර සහෝදරියන් වෙමු. මෙය සෙනහසේ සබැඳියාවයි. වෙන කිසිම ආකාරයක දැක්මක් නොතිබිය යුතුයි. සෑම කෙනෙකුගේම ලෙඩ රෝග ඒ ඒ ජීවාත්ම සත්තාවටම අදාල වූවකි. එමනිසා සෑම කෙනෙකුටම අවවාද ලැබෙන්නේ එයට ගැලපෙන අන්දමිනුයි. ඇතැම් අය අහනවා: බාබා මෙන්න මේ වගේ තත්ත්වයක් උද්ගත වෙලා තිබෙනවා. මම දැන් කළ යුත්තේ කුමක් ද? බාබා කියනවා: සහෝදරයෙක් හා සහෝදරියක් අතර වන දැක්ම කෙදිනකවත් නරක එකක් වන්නේ නැහැ. කිසිම සටනක් නොතිබිය යුතුයි. මම ඔය ජීවාත්මයන්ගේ පරමාත්ම පියායි. බ්‍රහ්මාගේ ශරීරය හරහා ශිව බාබා කතා කරයි. එමනිසා ප්‍රජාපිතා බ්‍රහ්මා ශිව බාබාගේ පුතායි. ඔහු ඇතුළු වන්නේ සාමාන්‍ය ශරීරයකටයි. විෂ්ණු අයිති ස්වර්ණමය යුගයටයි. පරමාත්ම පියා කියනවා: මා පැමිණ ලෝකය අලුත් කරවීම සඳහා මොහුට ඇතුළු වෙනවා. බාබා අහනවා: ඔබලා ලෝකයේ අග රජවරුන් රාජිණියන් වෙනවා ද? ඔව් බාබා, ඇයි නැත්තේ? හා හොඳයි, ඒත් ඔබලා පාරිශුද්ධව සිටිය යුතුයි. ඒකනම් අමාරුයි. ආනේ, ඒ වුණාට පරමාත්ම දෙවියන් ඔබලාව ලෝක පාලකවරුන් කරවනවානේ. ඉතින් පාරිශුද්ධ වෙන්න බැරි ද? ඔබට ඔබ ගැනම ලැජ්ජා නැති ද? ඔබලාගේ ශාරීරික පියා පවා කිසිම කිළිටි ක්‍රියාවක් කරන්න එපායි කියා ඔබලාට කියනවා. ඒ පාපය නිසා තමයි බාධක ඇති වන්නේ. මුල පටන්ම මහා කලබල. කරදර රාශියක්ම ඇති වුණේ ඒ පාපය නිසයි. පරමාත්ම පියා කියනවා: ආදරණීය දරුවනි, ඒ පාපය දමනය කර ඔබ ජය ගත යුතුයි. මා පැමිණ සිටින්නේ ඔබලාව පාරිශුද්ධ කරවීමටයි. යමක් හරිද වැරදිද කියා තේරුම් ගත හැකි ආකාරයේ බුද්ධියක් දැන් ඔය දරුවන්ට දී තිබෙනවා. ඔබගේ අරමුණ හා ඉලක්කය ලක්ෂ්මි නාරායනයි. දෙව්ලොව මිනිසුන්ට දිව්‍යමය ගුණධර්ම තිබෙනවා. කලි යුගයේ අයට ඇත්තේ දුබලතායි. දැන් මේ ඇත්තේ රාවණ රාජ්‍යයයි කියා කිසිම කෙනෙකුට

තේරෙන්නේ නැහැ. සෑම වසරකදීම ඔවුන් රාවණාගේ පඹයෙක් සාදා පුළුස්සනවා. ඔවුන් සෑම දිනකම එය පුළුස්සනවා. ඒත් ඒ කවුදැයි කියා ඔවුන් දන්නේ නැහැ. අපි සෑම කෙනෙක්ම අයිති රාවණ රාජ්‍යයටයි. ඉතින් ඒ නිසා අප සෑම කෙනෙක්ම යක්ෂයනුයි. කෙසේවෙතත්, කිසිම කෙනෙක් තමන් යකෙක් කියා සලකන්නේ නැහැ. මෙය යක්ෂ සමාජයක් කියා බොහෝ දෙනා කියනවා. පාලකයින්ගේ හැටියට තමයි පුරවැසියනුත්. කෙසේවෙතත්, ඒ මිනිස්සුන්ට ඒ තරම් දෙයක් වත් තේරෙන්නේ නැහැ. රාම රාජ්‍යය කියන්නේ රාවණ රාජ්‍යයෙන් වෙන් වූවක් බව පරමාත්ම පියා මෙහි ඉඳගෙන ඔබට කියා දෙනවා. ඔබලා දැන් සියලූම ගුණධර්ම වලින් පිරුණු අය වෙනවා. පරමාත්ම පියා කියනවා: මට වන්දනා කරන බැතිමතුන්ටත් දේවාල වලට ගිහින් දේවතාවරුන්ට වන්දනා කරන බැතිමතුන්ටත් මෙම ඥානය දෙන්න. නමුත් ඒ අයත් එක්ක ඔබ ඔබගේ ඔළුව ගසා ගන්න අවශ්‍ය නැහැ. දේවාල වලට එන බැතිමතුන් රැසක් ඔබට හමු වේවි. සෑම කෙනෙකුගේම නාඩිත් බැලිය යුතුයි. නාඩි බලා පමණක්ම ශබට ඇති රෝගය කුමක්දැයි කීමට ඇතැම් වෛද්‍යවරුන්ට පුළුවනී. අජ්මාල්කාන් කියා ඉතාමත් ප්‍රසිද්ධ හෝමියෝපති වෛද්‍යවරයෙක් දිල්ලි නුවර සිටියා. පරමාත්ම පියා ඔබව උපත් 21 කට සදා නිරෝගී හා ධනවත් අයෙක් කරවනවා. මෙහි සිටිනා සෑම කෙනෙක්ම සිටින්නේ ලෙඩින්... එහි කිසිම ලෙඩ රෝගයක් නැහැ. ඔබ සදා නිරෝගී සදා ධනවත් අය බවට පත් වෙමින් සිටිනවා. ඔබ යෝගා බලයෙන් ඔබගේ ඉන්ද්‍රියන් දමනය කර ගන්නවා. ඒ ඉන්ද්‍රියන්ට කවදාවත් ඔබව රවට්ටන්න බැහැ. බාබා කියා තිබෙනවා: නිවැරදි ස්මරණයේ නිරත වන්න. ජීවාත්ම අවධානයේ සිටින්න. ඔබගේ ඉන්ද්‍රියන්ට ඔබව රැවටිය නොහැකි වේවි. ඒ පාපයන්ගෙන් ඔබ ජය ගන්නේ මෙහිදීයි. එහිදී ඔබට කවදාවත් දර්ශනයක් ලැබුණේ නැහැ. රාවණ රාජ්‍යය එහිදී නැහැ. ඒ අවිහිංසක දේවතා ධර්මයයි. එහි කිසිම ආකාරයක යුද්ධයක් නැහැ. අවසානම යුද්ධය මෙයයි. මෙමඟින් දෙව්ලොවට දොරටු විවෘත වෙනවා. ඉන්පසුව ආයෙත් යුද්ධයක් ඇති වන්නේ නැහැ. අවසන්ම යාගය මෙයයි. පසුව කල්ප භාගයකටම ආයෙත් යාගහෝම ඇති වන්නේ නැහැ. සෑම කුණුකන්දලක්ම මෙයට බිලි දිය යුතුයි. මෙම යාගයෙන් විනාශයේ ගිණිදැල් මතු වී සියල්ලම පිරිසිඳු කර දමාවී. ඔය දරුවන්ට දර්ශන ලැබී තිබෙනවා. එහි පලතුරු යුෂ හරිම රසයි. අංක එකේ යුෂයි. ඔබ දැන් එම රාජ්‍යය ස්ථාපනය කරමින් සිටිනා නිසා ඔබ තුළ මහත් සතුටක් තිබිය යුතුයි. ඔබගේ නම ශිව ශක්තීන්, භාරත මාතාවන්. සිහි කිරීමෙන් පමණයි ඔබ ශිව දෙවියන් ගෙන් ශක්තිය ගන්නේ. එහෙ මෙහෙ යාමක් අවශ්‍ය වන්නේ නැහැ. භක්ති නොකරන ඕනෑම කෙනෙක් අදේවවාදියෙක් කියා මිනිස්සු හිතනවා. නමුත් ඔබ කියන්නේ පරමාත්ම පියාව නොදන්නා අය තමයි අදේවවාදීන් කියලා. ඔබලා දැන් දේවවාදීන් වී කාලත්‍රය ගැනම දන්නා අය බවටත් පත් වෙලා. ඔබ දැන් ලෝක තුනත් කාල තුනත් දන්නවා. ලක්ෂ්මී හා නාරායන් පරමාත්ම පියාගෙන් තම උරුමය දිනා ගත්තා. ඔබලාත් දැන් ඒ අය වගේ වෙමින් සිටිනවා. මේ සියල්ල පහදා දෙන්නේ පරමාත්ම පියාම පමණයි. පරමාත්ම පියාම කියනවා: මම මොහුට ඇතුළු වී ඔබට පහදා දෙනවා. අශාරීරික මම වෙන කොහොම පැහැදිලි කරන්න ද? උඩ ඉඳන් ඉඟි දුන්නයි කියා ඉගෙනීමක් සිදු වේවි ද? ඉගැන්වීමට කෙනෙකුට කටක් අවශ්‍යයි. මොහු තමයි ගෞමුක්ත් (ගව මුඛය). මොහු ජ්‍යෙෂ්ඨ මාතාවයි: ඔහු මානව මවක්. පරමාත්ම පියා කියනවා: මම මොහු හරහා ලෝකයේ මුල, මැද හා අග පිළිබඳව ඔය දරුවන්ට කියා දෙනවා. මම ඔබට දක්ෂ ක්‍රම පෙන්වා දෙනවා. මෙහිදී වෙන කිසිම ආශිර්වාදයක් කියා දෙයක් නැහැ. ඔබ මගේ උපදෙස් පිළිපැදිය යුතුයි. ඔබට ශ්‍රීමත් දී තිබෙනවා. කරුණාවක් නොවෙයි. ඔබෙන් ඇතැම් අය කියනවා: බාබා මට නිතර නිතරම ඔබව අමතක වෙනවානේ. මට අනුකම්පා කරන්න. අහා.. පරමාත්ම පියාව සිහි කිරීම ඔබගේ රාජකාරියයි. මම මොන කරුණාවක් දක්වන්නද? මට ඔබ සෑම කෙනෙක්ම මගේම දරුවෙක්. සෑම කෙනෙකුටම කරුණාව දැක්වූවා නම් ඒ සෑම කෙනෙක්ම ගිහින් සිහසුනේ අසුන් ගනීවි. කෙසේවෙතත්, ඔබ සෑම කෙනෙක්ම යම් තත්ත්වයක් දිනා ගන්නේ ඔබලාගේ ඉගෙනීමේ තරමටයි. ඉගෙන ගත යුත්තේ ඔබලායි. අඛණ්ඩව උත්සාහ දරන්න. සදාදරණීය පරම පියාණන්ව සිහිපත් කරන්න. අපිරිසිඳු ජීවාත්මයන්ට නිවස බලා යා නොහැකියි. පරමාත්ම පියා කියනවා: ඔය ජීවාත්ම සත්තාවන් මා සිහි කළ තරමට ඔබ පාරිශුද්ධ වී යාවි. පාරිශුද්ධ ජීවයකට මෙහි සිටින්න බැහැ. වරක් ඔබ පාරිශුද්ධ වුණු පසු ඔබට අලුත් ශරීරයක් අවශ්‍ය වෙනවා. පාරිශුද්ධ ජීවාත්මයකට අපිරිසිඳු ශරීරයක් ගැනීමට සිදු වෙනවාය යන්න නීතියේ නැති දෙයකි. සන්‍යාසීවරුනුත් ශරීර ගන්නේ පාපයෙන්. දේවතාවරුන් පාපයෙන් උපදින්නේ නැහැ. එසේ වුවහොත් ඔවුනටත් අත්හැරීමට යාමට සිදුවේවි. ඔවුන් උත්තමයින්ය. නිරන්තරයෙන්ම කිසිදු දුර්ගුණයකින් තොරව සිටිනා ඔවුන් සැබෑම මහත්මාවරුන් වේ. රාවණ රාජ්‍යය එහි නැහැ. එය රාමාගේ සතෝප්‍රධාන් රාජ්‍යයයි. ඇත්තටම කියනවා නම් රාමා කියාවත් නොකිය යුතුයි. ඒ ශිව් බාබායි. නැද්ද? අශ්ව බිල්ල බිල්ලට දෙන රුද්‍රාගේ අදෘශ්‍යමාන ඥාන යාගය කියන්නේ මෙයටයි. රුද්‍රා කියා කීවත් ශිවා කියා කීවත් දෙදෙනාම එක්කෙනයි. ක්‍රිෂ්ණාගේ නම සඳහන් කර නැහැ. ශිව බාබා පැමිණ ඥනය දෙනවා. මිනිස්සු බිලි

යාගයක් නිර්මාණය කළ විට මැටි වලින් ශිව පිළිමයක් හා සැලිග්‍රමයනුත් හදනවා. ඒවා වන්දනා කර පසුව කඩා දමනවා. බාබා දේවතා පිළිමවල උදාහරණය දෙනවා. ඔවුන් දේවතා පිළිම සරසා, කෑම බීම පිළිගන්වා, වන්දනාමාන කර පසුව දියේ ගිල්වා දමනවා. ඒ ලෙසින්ම ශිව බාබාගේ හා සලිග්‍රාම පිළිරූත් ඉතාමත් භක්තියෙන් සෙනෙහසින් වන්දනා කරනා ඔවුන් පසුව එය කඩා දමනවා. ඒ සියල්ල භක්තියේ ව්‍යාප්තියයි. පරමාත්ම පියා දැන් ඔය දරුවන්ට පහදා කියන්නේ ඔබලා පරමාත්ම පියාගේ සිහියේ රැඳී සිටි තරමට ඒ තරමම සතුටක් ඔබ තුළ ඇති වේවි. ඔබ සෑම රාත්‍රියකදීම තමන් අතින් කිසියම් වැරැද්දක් වුණාදැයි කියා පරික්ෂා කර බැලිය යුතුයි. ඔබ ඔබගේම කනිනි ඇද ගත යුතුයි. බාබා අද මම මේ වැරැද්ද කළා මට සමාවන්න. බාබා කියනවා: ඔබ ඇත්තම ලිව්වොත් පාපයෙන් බාගයකට සමාව ලැබේවි. පරමාත්ම පියා මෙහි අසුන් ගෙන සිටිනවා. තමාට යහපතක් උදා කර ගැනීම අවශ්‍ය නම් නොනවත්වාම ඔහුගේ ශ්‍රීමත් පිළිපදින්න. වාර්තා සටහන් පවත්වා ගැනීමෙන් ඔබට ලොකු වර්ධනයක් දැකිය හැකි වේවි. මෙයට කිසිම වියදමක් යන්නේ නැහැ. උසස් තත්ත්වයක් දිනා ගැනීමට අවශ්‍ය නම් ඔබගේ සිතුවිලි වචන හා ක්‍රියා මඟින් කිසිම කෙනෙකුට කිසිම දුකක් දෙන්න එපා. කවුරු කෙනෙක් කුමන හෝ වැරදි දෙයක් ඔබට කිවහොත් ඇහුනත් අහන්න එපා. මෙම උත්සාහය දරන්න. පරමාත්ම පියා පැමිණ සිටින්නේ ඔය දරුවන්ගේ සෑම දුකක්ම ඔබගෙන් මුදවා ගෙන ඔබව නිරන්තර සතුට කරා ගෙන යාමටයි. එමනිසා, ඔය දරුවනුත් මෙම තත්ත්වයට පත් විය යුතුයි. හොඳම සේවය කළ හැක්කේ දේවාල වලදීයි. බොහෝ හොඳ දැහැමි ආගමික අයව ඔබට එහිදී මුණ ගැසේවි. ප්‍රදර්ශන වලට බොහෝ දෙනා පැමිණෙනවා. ප්‍රදර්ශන වලදී කරනා සේවය ප්‍රොජෙක්ටර් යන්ත්‍ර වලින් කරනා සේවයට වඩා හොඳයි. ප්‍රදර්ශන සඳහා වියදමක් දැරිය යුතුයි. එමනිසා, අනිවාර්යයෙන්ම යහපතක් සිදුවේවි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. හරි දේ හා වැරදී දේ අතර වෙනස අවබෝධ කර ගත හැකි ආකාරයේ බුද්ධියක් පරමාත්ම පියා ඔබට දී තිබෙනවා. එමනිසා, මෙම බුද්ධියෙන් යමක් අවබෝධ කර ගැනීමේ පදනම මත දිව්‍යමය ගුණධර්ම ධාරණය කර ගන්න. කිසිම කෙනෙකුට දුකක් දෙන්න එපා. ඔබ අතර සහෝදර සහෝදරියන්ගේ සැබෑ සෙනෙහස තිබිය යුතුයි. කිසිම කෙනෙක් කෙරෙහි නරක දැක්මක් තබා ගන්න එපා.
2. පරමාත්ම පියා දෙන සෑම උපදේශයක්ම පිළිපැද, හොඳින් ඉගෙන ගෙන තමා කෙරෙහිම කරුණාව දක්වා ගන්න. ඔබගේ ස්ව වර්ධනය සඳහා වාර්තාවක් පවත්වා ගන්න. කෙනෙක් දුක හිතෙන දෙයක් කිවහොත් ඇහුණත් අහන්න එපා.

**වරදානය:** ඔබ පුණ්‍යාත්මයක් වී, දේව රාජකීයත්වයේ සංස්කාරයෙන්, එක් එක් අයගේ විශේෂතා ගැන කතා කරන්න.

සෑම විටම ඔබ විශේෂ ජීවාත්මයක් ලෙස සලකමින් සෑම සිතිවිල්ලක්ම නිර්මාණය කර, සෑම ක්‍රියාවක්ම සිදු කරන්න. සෑම කෙනෙකුගේම විශේෂතා දැක විශේෂතා ගැන කතා කරන්න, සෑම කෙනෙකුම විශේෂ කරවීමට නිරන්තරව යහපත සලසන සුබ පැතුම් වලින් යුතු වන්න. මෙය දේව රාජකීයත්වයයි. රාජකීය ජීවාත්මයන්ට අන් අය ඉවත දැමූ දේවල් උකහා ගත නොහැක. එබැවින්, ඕනෑම කෙනෙකුගේ දුර්වලතා හෝ අඩුපාඩු දැකීමට ඔබේ ඇස් වසා ඇති බවට නිරන්තරව අවධානය යොමු කරන්න. එකිනෙකාගේ ප්‍රශංසා ගීත ගායනා කරන්න, එකිනෙකා සමඟ සෙනෙහසේ සහ සහයෝගීතාවයේ මල් හුවමාරු කරගන්න, එවිට ඔබ පුණ්‍යාත්මයක් වනු ඇත.

**පාඨය:** **අව්‍යක්ත සංඥාව: දැන් සම්පූර්ණ හා කර්මාතීත් වීමේ ගැඹුරු සැලකිල්ල ඇති කරගන්න.**

***** ඕම ශාන්ති *****

අශාරීරික ස්වරූපයේ ප්‍රධාන ඉගැන්වීම් වල ආශිර්වාදය නම් “ඔබ කර්මාතීත් වේවා!” සූක්ෂම ස්වරූපයේ, එනම්, සුරදූත ස්වරූපයේ ආශිර්වාදය නම් “ඔබ ද්විත්ව ආලෝකය වේවා!” “ද්විත්ව ආලෝකය” යන්නෙන් අදහස් කරන්නේ කර්මයේ සියලු බන්ධන වල සැහැල්ලු වීමයි, ආලෝකය යනු ආලෝකයේ ස්වරූපයෙන්

නිරන්තරව ස්ථාවරව සිටීමයි. මේ ආකාරයෙන් ද්විත්ව ආලෝකයේ රැඳී සිටින අයට පහසුවෙන් කර්මතීත් අවධියට ළඟා විය හැකිය. එබැවින්, සේවයේ නියැලෙන අතරතුර, දැන් මෙම ගැඹුරු සැලකිල්ල ඇති කරගන්න, ‘‘මම සම්පූර්ණ වී කර්මතීත් විය යුතුයි.’’